# පරීක්ෂක වාර්තාව

## AA1 විභාගය - ජනවාරි 2020

# (AA13) ව්‍යාපාර ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

ව්‍යාපාර හා ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයීමේ දී බහුතරයක් අයදුම්කරුවන් ප්‍රමාණික මට්ටමින් සාර්ථකව පිළිතුරු සපයා ඇතිබව විද්‍යාමාන විය. කෙසේ වෙතත් සමස්තයක් ලෙස ගත්කල සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු වල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි. ඒ පිළිබඳ උත්තර පත්තර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ.

## <u>A - කොටස</u>

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

ප්‍රශ්න අංක **01** - ලකුණු 40

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

සමස්තයක් ලෙස ගත්කල අදාල විෂය නිර්දේශයෙහි වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් සඳහා මෙම කොටස් සකස් වී තිබේ. එසේම මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායන් සංකල්ප පදනම්කර ගනිමන් විෂය නිර්දේශයේ බරතැබීම් වලට ගැලපෙන ලෙස මෙය සැකසී තිබේ. ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා දෙන ලද වරණයන් අතුරෙන් නිවැරදි වරණය තේරීමටත් ප්‍රශ්න **1.11** සිට **1.15** දක්වා යම් ප්‍රකාශයක් ලබා දී එහි සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීමටත් ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා දෙන ලද පිළිතුරු දෙකක් අතුරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලිවීමටත් ලෙස සරල ආකෘතියක් යටතේ මෙම ප්‍රශ්නය සකස්කර ඇත.

මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් නිවරදිව පිළිතුරු සපයා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. කෙසේ වෙතත් මෙහි සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ උත්තරවල අඩුපාඩු නිරීක්ෂණය විය.

**<u>අයදුම්කරුවන් සැපයූ පිළිතුරු අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:</u>**

**1.3** මිල ඉල්ලුම් නම්‍යතාවයේ ප්‍රභේදයක් වන හරස් ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ වූ ප්‍රශ්නයකි. මෙහිදී සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් විය.

**1.6** මෙම ප්‍රශ්නය මගින් මූල්‍ය ආයතන පිළිබඳ ඇති දැනුම පරීක්ෂාකර ඇත. මූල්‍ය ආයතන පද්ධතිය සම්බන්ධ වූ දැනුම මදකම නිසා මේ සඳහා පිළිතුරු ලබා දීමට සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසකට නොහැකි විය

**1.8** මෙමගින් දේශීය මුදල් ඒකකයකින් විදේශිය වෙළඳපොලකදී මිලදී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය හඳුන්වනු ලබන නාමය පිළිබඳ දැනුම පරීක්ෂාකර ඇත. ස්වඅධ්‍යයන පාඨමාලා පොත් හා ආර්ථික විද්‍යාව සම්භන්ධ පොත්පත් පරිශීලනය මඳකම නිසා හා න්‍යායාත්මක දැනුම අඩුකම නිසා නිවැරදි පිළිතුර සැපයීමට සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසකට නොහැකි විය.

**1.9** මෙය ආර්ථික විද්‍යාව සම්බන්ධ සාමාන්‍ය දැනුම පරීක්ෂාකළ ප්‍රශ්නයකි. මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2018 වර්ෂයේ ඒකපුද්ගල ආදායම කොපමණද යන්න ප්‍රශ්ණයෙන් බලාපොරොත්තු වේ. මෙහිදී ශ්‍රී ලංකාවේ ආර්ථික විද්‍යාව පිළිබඳ තොරතුරු සඳහන් පොත්පත් පරිශීලනය නොකිරීම හේතුවෙන් මේ සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට බහුතරයක් අයදුම්කරුවන්ට නොහැකි විය.

**1.11 - 1.15** දක්වා දෙන ලද ප්‍රකාශයන් හි සත්‍ය අසත්‍ය බව සටහන් කිරීමෙන් නිවැරදි පිළිතුර තෝරාගත යුතු විය. එම ප්‍රශ්ණ පහ අතුරින් අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් වැරදි උත්තර සපයා තිබුණේ **1.11** සහ **1.15** ටය.**1.11** ප්‍රශ්ණය මඟින් ආදායම් වෘත්තාකාර ප්‍රවාහය පිළිබඳ දැනුම පරීක්ෂාකර ඇත. **1.15** ප්‍රශ්නය මඟින් සාමාන්‍ය පිරිවැය වක්‍රය හා ආන්තික පිරිවැය ආශ්‍රිත දැනුම පරීක්ෂාකරන ප්‍රශ්නයකි. ඉහත සඳහන් කොටස් පිළිබඳ න්‍යායාත්මක දැනුම මඳකම නිසා සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මේ සඳහා නිවැරදි උත්තර සපයා නොතිබුණි.

**1.16 - 1.20** ප්‍රශ්නවලට දෙන ලද උත්තර දෙක අතුරින් නිවැරදි පිළිතුර තොරාගත යුතු විය. ඉන් වැඩි ප්‍රමාණයක් වැරදි පිළිතුරු තිබුණේ **1.17** සහ **1.18** යන ප්‍රශ්න සඳහා ය. මෙහිදී පහත සඳහන් විෂය කරුණු පිළිබඳ මනා අවබෝධයක් නොමැතිබව අනාවරණය විය:

- මුදල් සැපයුම
- ඒකාධිකාරී තරඟය

## <u>B කොටස</u>

(අනිවාර්ය ප්‍රශ්න හතරකි)

ප්‍රශ්න අංක **02** - ලකුණු 10

**(a)** **(i)** ආර්ථික විද්‍යාවේ පදනම ලෙස සලකන හිඟකම නැමැති සංකල්පය පිළිබඳ අවබෝධය පරික්ෂා කිරීමට දෙන ලද ප්‍රශ්නයකි. බොහෝමයක්ම අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා මුළු ලකුණු ලබාගෙන ඇත.

**(ii)** මෙම කොටසින් තෝරාගැනීම හා ආවස්ථික පිරිවැය අතර වෙනස පැහැදිලි කිරීම බලාපොරොත්තු විය. තෝරාගැනීම යනු තමන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා ඉල්ලුම් කිරීම ලෙස ලියා ඇත. එහෙත් සමහර අයදුම්කරුවන් තෝරාගැනිම කරන විට යම් දෙයක් අත්හැරීමට සිදුවේය යන්න සඳහන් කර නොතිබුණි. එබැවින් ආවස්ථික පිරිවැය පිළිබඳව නිවැරදි අවබෝධයකින් යුතුව පිළිතුර සපයා නොතිබුණ බව දක්නට ලැබුණි.

**(b)** ආර්ථික ක්‍රම පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමට ඇති මෙම ප්‍රශ්නයට සමාජවාදී ආර්ථිකයේ ලක්ෂණ ලෙස සමහර සිසුන් ඉල්ලුම හා සැපයුම සමාන වීම, ආර්ථිකය සිඝ්‍රයෙන් වර්ධනය වීම වැනි වැරදි පිළිතුරු අනවබෝධයෙන් යුතුව සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් එකම කරුණ විවිධ ආකාරයෙන් ලියා ලකුණු අඩුවෙන් ලබාගෙන තිබූ අතර නිවැරදි පිළිතුරු ලියූ අයදුම්කරුවන් බොහෝ පිරිසක් විය.

ප්‍රශ්න අංක **03** - ලකුණු 10

**(a)** **(i)** වෙළඳපොළ ඉල්ලුම් සැපයුම් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයේදී සපයා ඇති සමීකරණයට අනුව බොහෝමයක් අයදුම්කරුවන් මිල නිවැරදිව ගණනය කර තිබුණද ප්‍රමාණය සෙවීමේදී වැරදි ලෙස ගණනය කිරීමෙන් ගණිතමය ගැටළු විසඳීමට එතරම් අවබෝධයක් නොමැති බව සමහර සිසුන්ගේ ගණනය කිරීම අනුව පෙනුනි. නමුත් අතලොස්සක් සිසුන්,මිල හා ප්‍රමාණය නිවැරදිව ගණනය කර තිබුණි.

**(ii)** වෙළඳපොල සමතුලිතය ගැන අයදුම්කරුවන්ගේ අවබෝධය පරීක්ෂා කිරීමට දෙන ලද මෙම ප්‍රශ්නයේදී පාරිභෝගික ආදායම වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහතින් සොයන ලද සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි ඇති බලපෑම පිළිබඳ සැලකිය යුතු සිසුන් ප්‍රමාණයක් ඉල්ලුම් වක්‍රය වැඩිවීම / විතැන්වීම ලෙස වැරදි ආකාරයෙන් විස්තර කර තිබුණි.

**(b)** පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ලාභ උපරිම කරනු ලබන ආකාරය පරීක්ෂා කිරීමට දෙන ලද ප්‍රශ්නයක් ලෙස සැලකිය හැක. බොහෝ අයදුම්කරුවන් නිවැරදි ආකාරයට ප්‍රස්තාර සටහන ඇඳ එය ලකුණු කිරීමට අපොහොසත් වීමෙන් මුළු ලකුණු ලබාගැනීමට නොහැකි වුණි. විවිධ වෙළඳපොලවල් පිළිබඳ දැනුම ඉතාමත් අඩුබව පෙනේ.

ප්‍රශ්න අංක **04** - ලකුණු 10

**(a)** උපරිම මිල හා අවම මිල අතර වෙනස දක්වන ලෙස මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම සංකල්පය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති අයදුම්කරුවන් බොහෝ විය. බොහෝ අයදුම්කරුවන් වචනයේ අර්ථය ගෙන උපරිම මිල හා අවම මිලෙහි අදහස මාරුකර ලියා ඇත. පාරිභෝගිකයින් වෙළෙඳපොලේ භාණ්ඩ මිලදීගැනීමේදී ගැනුම්කරුවන්ට අසාධාරණ වූ විට රජය විසින් නියම කරනු ලබන සමතුලිත මිලට වඩා ඉහළ මිල සීමාව උපරිම මිල ලෙස වැරදි ලෙස ලියා ඇත. අවම මිල යනු සමතුලිත මිලට වඩා පහළින් මිල නියම කිරීමක් ලෙස ලියා තිබුණි. ආර්ථික විද්‍යාව පිළිබඳ බොහෝමයක් අයදුම්කරුවන්ට න්‍යායාත්මක දැනුම මඳකම මෙමගින් විද්‍යාමාන විය.

**(b)** රාජ්‍ය අයවැය ලේඛනය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නය බොහෝ අපේක්ෂකයින් නිවැරදි පිළිතුර සපයා මුළු ලකුණු ලබාගත්තද සමහර අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබාගැනීමට නොහැකිවී ඇත්තේ අයවැය හිඟය සම්බන්ධව අවබෝධයකින් තොරව පිළිතුරු සැපයූ නිසාය.

ප්‍රශ්න අංක **05** - ලකුණු 10

**(a)** **(i)** මුදල් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දි ඇති මෙම ප්‍රශ්නයේදී මුදලේ කාර්ය පිළිබඳ සමහර අයදුම්කරුවන් ලියු පිළිතුරු අතර මුදල් නිත්‍ය ඒකකයක් වශයෙන් ලග තබා ගැනීම, ගනුදෙනු කිරීමට මුදල් අත්‍යාවශ්‍ය බව, වටිනාකම මැනීමේ මාධ්‍යයක් ලෙස ක්‍රියා කරනබව පිළිතුරු වශයෙන් ලියාතිබුණි. මුදලේ කාර්යයන් වෙනුවට මුදලේ ලක්ෂණ ලියු ඇතැම් අයදුම්කරුවන්ද විය.

**(ii)** මෙමඟින් මිල මට්ටම හා මුදලේ අගය අතර සම්භන්ධතාවය පිළිබඳ දැනුම පරීක්‍ෂාකර ඇත. මුදලේ අගය මත සාමාන්‍ය මට්ටම තීරණය වන බවත්, මුදලේ අගය වෙනස්වීම මත සාමාන්‍ය මිල මට්ටම වෙනස් වන බවත් දක්වා ඇත. සමහර අයදුම්කරුවන් සාමාන්‍ය මිල මට්ටම විවිධ කාල වලදී විවිධ ලෙස වෙනස්වීම් වලට භාජනය වන බව දක්වා ඇත. සාමාන්‍ය මිල මට්ටම හා මුදලේ අගය අතර සම්බන්ධය ගැන සිසුන්ට අවබෝධයක් නොමැති බව බහුතරයක් අයදුම්කරුවන්ගේ පිළිතුරු මඟින් මනාව පැහැදිලි විය.

**(b)** **(i)** ආරක්ෂණවාදය යන සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධයක් සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසකට නොතිබෙන බව පෙණුනි.එය ආරක්ෂණවාදය යනු රුපියලේ අගය පවත්වාගෙන යාම ලෙස පිළිතුරු දීමෙන් පැහැදිලිවේ. ඇමරිකානු ඩොලරයට අනුව රුපියලේ අගය පවත්වාගෙන යාම ලෙසද අයදුම්කරුවන් කිහිප දෙනෙක් ලියා තිබුණි. සමහර සිසුන් රක්ෂණයේ අංගයක් ලෙස ආරක්ෂණවාදය හඳුන්වා දී තිබුණි. ආර්ථික විද්‍යාවේදී භාවිතාකරන පාරිභාෂික පද පිළිබඳ පවතින දැනුම අඩුකම මෙමගින් පැහැදිලි විය.

**(ii)** ආරක්ෂණ වාදයේ වාසි ලෙස, නීති රෙගුලාසි කරුණු විශාල ප්‍රමාණයක් නොමැති වීම, ඕනෑම කාලයකට වලංගු වීම වැනි අදාළ නැති කරුණු සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් ලියා තිබුණි.

## C කොටස
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක **06** - ලකුණු 20

**(A)** **(a)** ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන් පිළිබඳ දැනුම පිළිතුර ලෙස පරීක්ෂාකර ඇතත් ආනයනකරුවන්ට උපකාරී කිරීම, ආයෝජනකරුවන්ට උපදෙස් දීම වැනි සාවද්‍ය කරුණු ඉදිරිපත්කර තිබුණි. ආර්ථික විද්‍යාව පිළිබඳ පොත්පත් පරිශීලනය මඳකම නිසා බොහෝ අයදුම්කරුවන්ට මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලිවීමට නොහැකිවී ඇති බව පෙනේ.

**(b)** මුල්‍ය අතරමැදිකරණයෙහි අදහස නිවැරදිව ලියා ඇත්තේ අයදුම්කරුවන් කිහිපදෙනෙකු පමණි. මුල්‍ය අතරමැදිකරණය යනු පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් පුද්ගලයින්හට ආයෝජන කරුණු පිළිබඳ උපදෙස් ලබාදීමට කටයුතු කිරීම,බැංකු මැදිහත්වීමක් මගින් කරන කටයුතු හා ගනුදෙනුකරුවන්ට උපදෙස් දීම වැනි නොගැලපෙන ආකාරයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් ද විය.

**(B)** **(a)** ජාතික ගිණුම් සංකල්පය ගැන අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයේදී බොහෝ අයදුම්කරුවන් අවබෝධයකින් තොරව පිළිතුරු සපයා තිබුණි. දී ඇති කල්පිත අගයන් පිළිවෙලින් ලියා එකතු කිරීමෙන් ලකුණු ලබාගත්තද මූලික මිලට සමස්ත එකතු කළ අගය ලැබෙන බව නොපෙන්වා තිබුණි.

**(b)** වෙළෙඳපොල මිලට දළදේශිය නිෂ්පාදිතය බොහෝ සිසුන් ගණනය කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් පමණක් නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ලබාගෙන තිබුණි. සමහර සිසුන් වෙළඳපොල මිලට දල දේශිය නිෂ්පාදිතය ගණනය කිරීමේදී බදු අඩුකර සහනාධාර එකතුකර ඇත. සමහරක් අයදුම්කරුවන්ට මේ සම්බන්ධයෙන් න්‍යායාත්මක දැනුම හා අවබෝධය ඉතාමත් අල්ප බව පෙනේ.

**(C)** ආර්ථික සංවර්ධනය හා තිරසාර සංවර්ධනය අතර වෙනස පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් දක්වා ඇතත් බහුතරයක් අයදුම්කරුවන් ආර්ථික සංවර්ධනය අර්ථකථනය කර ඇතත් තිරසාර සංවර්ධනය පිළිබඳ දැනුම මඳකම හේතුවෙන් පූර්ණ වශයෙන් පිළිතුර ගොඩනගා ගැනීමට අපොහොසත් වීමෙන් මුළු ලකුණු ලබාගත නොහැකි විය.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශීය පූර්ණ වශයෙන් හොදින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශිලනය කිරීම.

(5) උත්තර ලිවිමේදි මූලික න්‍යයාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදිමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශිලනය කිරිමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනිම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදිමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -